# මිහින්තලේ ස්පර්ශීය සංස්කෘතික උරුමය කෙරෙහි සංචාරක ව්‍යාපාරයේ බලපෑම

සමරවීර එස්.එම්.පී.එච්,[1] පෙරේරා පී.කේ.යූ.[2]

ශ්‍රී ලංකාව යනු ස්පර්ශීය සහ අස්පර්ශීය සංස්කෘතික උරුම වටිනාකම් සහිත ආකර්ශනීය ස්ථාන දහස් ගණනක් ඇති රටකි. මෙම සංස්කෘතික උරුමයන් කෙරෙහි සංචාරක කර්මාන්තයේ බලපෑම් ද නිතර වාර්තා වේ. එබැවින් සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් කෙරෙහි බලපාන ආකාරය හඳුනා ගැනීමට ක්‍රමානුකූල විමර්ශනයක් අවශ්‍ය වේ. ගුණාත්මක පර්යේෂණ ප්‍රවේශයක් අනුගමනය කරමින්, මෙම අධ්‍යනය ශ්‍රී ලංකාවේ ප්‍රධාන උරුම ස්ථාන වලින් එකක් වන මිහින්තලයේ ස්පර්ශීය සංස්කෘතික උරුම වටිනාකම් කෙරෙහි සංචාරක ව්‍යාපාරයේ බලපෑම පිළිබඳ අවධානය යොමු කරයි. පහසු සහ අරමුණු සහිත නියැදි ක්‍රම භාවිතා කරමින් මිහින්තලේ පුරාවිද්‍යා කාර්යාලයේ සහ පොලිස් ස්ථානයේ නිලධාරීන් සමඟ සම්මුඛ සාකච්ඡා, ස්ථානීය හා සහභාගීත්ව නිරීක්ෂණ මෙන්ම පර්යේෂකයා විසින් ගන්නා ලද ඡායාරූප වැනි විවිධ මූලාශ්‍ර වලින් දත්ත රැස් කරන ලදී. අදාළ පරිදි තේමාත්මක, අන්තර්ගත, රූප සහ විස්තරාත්මක විශ්ලේෂණ ශිල්පීය ක්‍රමය භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදී. ප්‍රතිඵල වලින් පෙනී යන්නේ සංචාරක ව්‍යාපාරය මගින් උරුම දේපළ වලට භෞතික හානි, උරුමයන් නශ්‍ය වීම, සංස්කෘතික උරුමයන් විකෘති කිරීම හා විනාශ කිරීම, උරුම දේපළ අස්ථානගත කිරීම සහ පූජනීය ස්ථානවල අහිතකර සංචාරක හැසිරීම් වැනි සෘනාත්මක බලපෑම් ඇති වන බවයි. එමෙන්ම උපකල්පිත යොදා ගනිමින් මෙම අහිතකර බලපෑම් සඳහා හේතු පාදක වන සාධක ද මෙම අධ්‍යනය මඟින් හඳුනාගන්නා ලදී. එනම් උරුම දේපල වල භෞතික ස්වරූපය, අධික භක්තිය, අතීත සංචාරකයින්ගේ හැසිරීම්, උරුම දේපල වල වටිනාකම වැනි දෑ මෙම බලපෑම් සඳහා බලපාන බවයි. සංස්කෘතික උරුම ස්ථානවල සංචාරක ව්‍යාපාරයේ ප්‍රතිවිපාකවල සන්දර්භය පිළිබඳ නිසි අවබෝධයක් මෙම අධ්‍යනයේ ප්‍රතිඵල මගින් ලබා දේ. මෙම අධ්‍යනයේ ප්‍රතිඵල අනුව මේ හා සමාන බලපෑමක් ශ්‍රී ලංකාවේ අනෙකුත් උරුම භූමි කෙරෙහි ද සංචාරක ව්‍යාපාරයෙන් සිදු වන බව උපකල්පනය කළ හැක.

**මුඛ්‍ය පද :** සංස්කෘතික උරුමය, සංස්කෘතික සංචරනය, සංචාරක බලපෑම, සෘනාත්මක බලපෑම.

[1,2] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, සංචාරක හා සත්කාරක සේවා කලමනාකරණ අධ්‍යයනාංශය,ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. smpiyumi@gmail.com